**ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය - 2018**

**-----------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අභිතකර මතය**

ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අභිතකර මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු
  විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේදී පාරිතෝෂිත ගණනය කිරීමේදී දල වැටුපෙහි ගැලපුම් දීමනාවද ඇතුලත්ව පාරිතෝෂිත වෙන්කිරීම් ගණනය කිරීම හේතුවෙන් රු.12,114,266 ක් වැඩියෙන් වෙන්කිරීම් කර තිබුණි. තවද ප්‍රමිත 03 හි 47 ඡේදය (අ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී වරද නිවැරදි කර සංසන්දනාත්මක අගයන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පාරිතෝෂිකයක් වෙන් කරනු ලබන්නේ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය අගයන් වෙත (එනම් ආයතනයේ ලාභ / අලාභයට) අනපේක්ෂිත බලපෑම් අවම කිරීමේ පදනම මත වන අතර, ගෙවීම් කිරීමේදී නිවැරදිව ගණනය කර ගෙවීම් කරනු ලැබේ. ඉදිරියේ දී ගැලපුම් දීමනා මූලික වැටුපට නිශ්චිතවම එකතු වන බැවින් පාරිතෝෂික වෙන් කිරීම සඳහා ගැලපුම් දීමනා අදාළ කිරීම ආරක්ෂණ/ විචක්ෂණ (Prudence Concept) සංකල්පයට අනුකූල වේ. | 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ගෙවන මූලික වැටුප සහ ජීවන වියදම් දීමනා සඳහා පාරිතෝෂිත වෙන්කිරීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 වගන්තිය පරිදි දේපළ ,පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට වසර 03 කට හෝ වසර 05 කට වරක් ප්‍රත්‍යාගණනය සිදුකිරීම කළ යුතු වුවද, අධිකාරියේ ආරම්භක වර්ෂය වන 1998 වර්ෂයෙන් පසුව වූ සියළුම වත්කම් වෙනුවෙන් ප්‍රත්‍යාගණන කටයුතු සිදුකර නොතිබුණි. | 2012.12.31 දිනට සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට 2013 වර්ෂයේදී ලබා දී ඇතත් එම දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති වාර්තා අසම්පූර්ණ වීම හා ඒවා සම්පූර්ණ කර ලබාදීම මේ දක්වා සිදුකර නොමැති බැවින් ගිණුම්වල ගැලපීම සිදුකිරීමට නොහැකි වී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 14 ඡේදය ප්‍රකාරව උපචිත පදනම මත ආදායම් ගිණුම්ගත කළ යුතු වුවත්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ ඇතිකර ගත් ගිවිසුම අනුව 2018 වර්ෂයේදී ලැබිය යුතු රු. 299,222 ක්, උපචිත පදනම මත ගිණුම්ගත කර නොතිබුණි. | 2018 වර්ෂයේ උඩවලව මධ්‍යස්ථානයෙන් ලද මැණික් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියක් සිදු කළ අතර අප වෙත වටිනාකම් ලිඛිතව දැනුම් දෙනු ලබන බව සඳහන් කළත් 2018 අවසානය දක්වා තොරතුරු ලබාදී නොමැත. උපචිත පදනම මත ගිණුම්ගත කිරීමට එම ආදායමේ හෝ වියදමේ නිවැරදි වටිනාකම හඳුනාගෙන තිබිය යුතුය. | වෙන්දේසියේදී ගිවිසුම් අනුව අධිකාරියට ලැබිය යුතු ප්‍රමාණය ලබා ගෙන එය උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අධිකාරියට භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.250,000,000 ක් අමාත්‍යාංශ ප්‍රදාන රු.833,996,183 ක් පුනරාවර්ථන ප්‍රදාන රු.380,000,000 ක් සහ ජීව විද්‍යාත්මක වත්කම් රු.15,539,130 ක් ගිණුම්ගත කිරීම සඳහා වූ ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ අංක 2.6 හා අංක 2.11 යටතේ හෙළිදරව් කර ඇත.<br>නමුත් 2019 වර්ෂයේ ගිණුම් සඳහා භාවිතා කළ ක්‍රමවේද, පදනම්, ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශනයට බලපාන තොරතුරු පිළිබඳව හෙළිදරව් කිරීම වැඩිදියුණු කිරීමට කටයුතු කෙරේ. | ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිකිරීම් කොන්ත්‍රාත් 08 කට අදාළ රඳවා ගැනීම් මුදල් රු.3,097,101 ක් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කර නොතිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කෙරීගෙන යන වැඩ වටිනාකම වූ රු. 56,814,799 ක් තුළ ඇතුලත් කර තිබුණි. | 2018 වර්ෂයේ ගිණුම් සකස් කිරිමේ දී අතපසු වීමකින් කොන්ත්‍රාත් මත රඳවා ගත් මුදල් සටහන් වී ඇත. 2019 වර්ෂයේ මෙම කරුණු ද සැලකිල්ලට ගෙන කටයුතු කරමි. | නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කළ යුතුය. |
| (ආ) | නුවරඑළිය ප්‍රාදේශීය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටි ඉඩම 1999 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ප්‍රදානයක් ලෙස අධිකාරියට පවරා දී තිබුණු අතර එහි වටිනාකම රු.12,635,000 කට තක්සේරුකර ගිණුම්ගත කර තිබුණි. පසුව මෙම ඉඩම සම්බන්ධයෙන් ඇති වූ නිරවුල් කිරීමේ ගැටළුවක් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ එම ඉඩම මිලදී ගැනීම සඳහා රාජ්‍ය සංස්ථාවකට රු.9,237,500 ක් ගෙවා තිබුණි. පසුව ගෙවන ලද මුදල රාජ්‍ය ප්‍රදානයට අදාළ ප්‍රාග්ධන සංචිතයෙන් අඩුකර දක්වනු වෙනුවට ඉඩමේ වටිනාකමට එකතුකර තිබුණි. | ඉඩමේ තක්සේරු වටිනාකම රු.18,475,000/- ලෙස දන්වා ඇත. ඉඩම් වටිනාකම ලෙස ගිණුම්ගත කළ යුතු වන්නේ රු.5,840,000/- වන අතර ඒ අනුව වැඩි පුර ගිණුම්ගත වූ මුදල රු.3,397,500 ක් වේ. නමුදු රු.18,475,000 ලෙස ගිණුම් තුලින් ඉඩමේ වටිනාකම හඳුනා ගත යුතු යැයි සඳහන්ව නොමැති අතර මෙම වටිනාකම ද 2014 ජුනි 16 දි තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද තක්සේරු වටිනාකමක් වේ. | තක්සේරු වටිනාකමට ඉඩම් ගිණුම්ගතකර ඇති බැවින් පසුව ගෙවන ලද මුදල සංචිත වලින් අඩුකර දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් 19 ක වැඩ වටිනාකම ගිණුම්ගත කිරීමේදී, ගිණුම්ගත කළ යුතු වටිනාකමට වඩා රු.35,808,699 ක් අඩුවෙන්ද, ඉදිකිරීම් කොන්ත්‍රාත් 08 ක ගිණුම්ගත කළ යුතු වටිනාකමට වඩා රු. 11,361,326 ක් වැඩියෙන්ද, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිකිරීම් කටයුතු අවසන් කොන්ත්‍රාත් ප්‍රාග්ධනිත කළ අතර ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින කොන්ත්‍රාත් කෙරිගෙන යන වැඩලෙස හඳුනා ගන්නා ලදි. විගණන විමසුමේ දක්වා ඇති තොරතුරු අධ්‍යනය කර 2019 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | නිමකර අවසන් වූ ඉදිකිරීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | උඩවලව ප්‍රාදේශීය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයෙහි කම්කරු නේවාසිකාගාරය ඉදිකිරීම් කටයුතු 2018 නොවැම්බර් 30 දින අවසන් කර තිබියදී ඒ වෙනුවෙන් වැයකරන ලද රු.12,346,772 ක් ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කරනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 30 දින ඉදිකිරීම් අවසන් කර කොන්ත්‍රාත්කරුගෙන් භාරගත් දිනය වන අතර අවසන් බිල්පත 2019 මාර්තු 08 ඉදිරිපත් කර ඇත. මෙම ඉදිකිරිම වත්කමක් ලෙස හඳුනා ගැනීමට සම්පූර්ණ ඉදිකිරීම් වටිනාකමක් ගිණුම් අංශයට වාර්තා නොවීම හා ගණනය කිරීමට තොරතුරු ඉදිරිපත් වී නොමැති කම මත මෙම ඉදිකිරිම කෙරිගෙන යන වැඩ ලෙස ගිණුම් තුලින් හඳුනා ගෙන ඇත. | ඉදිකිරීම් අවසන් කරන ලද ගොඩනැගිලි වත්කම් ලෙස දැන්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ගිණුම් ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා ප්‍රාග්ධන ප්‍රදානවලින් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වැය කර ආදායමට ලියා හැර තිබුණු රු.160,131,832 ක පුනරාවර්තන ස්වරූපයේ වියදම්වලට අදාළ ප්‍රදාන, ආදායම් ප්‍රකාශයේ ආදායම් ලෙස ගිණුම්ගත නොකර සංචිතයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ ආකාරයට ගිණුම් තැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභයද රු.54,726,364 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබුණි. | නිවැරදි ක්‍රමවේදය හඳුනාගෙන 2019 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | ප්‍රාග්ධන ප්‍රදාන හා පුනරාවර්ථන ප්‍රදාන නිවැරදිව හඳුනාගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ගිණුම්කරන ප්‍රතිපත්ති සකස් කර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු වීම. |
| (ඊ) | ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීමේ ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා අධිකාරිය විසින් මත්ස්‍ය පැටව් බෝකිරීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන මව් මත්ස්‍ය තොගයෙහි ආරම්භක සහ අවසාන තොගෙවල වටිනාකම් ඒවායේ සාධාරණ අගය හඳුනා ගැනීමකින් තොරව විකුණුම් පිරිවැයට ගලපා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ දළ ලාභය රු.7,462,530 කින් වැඩියෙන් දක්වා තිබුණි. | විකුණුම් පිරිවැයට හඳුනා නොගත්තේ නම් මව් මත්ස්‍යයයින් වත්කමක් ලෙස හඳුනා ගැනිමක් සිදු කළයුතුය. එසේ වූවහොත් වාර්ෂිකව ආරම්භක හා අවසාන මව් මත්ස්‍ය තොග ශේෂ දෙක අතර අතිවන අඩු / වැඩි වෙනසද ගැලපිය යුත්තේ ලභා, ලාභ ගිණුමටම වේ. ඒ අනුව සමාලොචිත වර්ෂයේ දි අලාභය අඩුවෙන් දක්වා නොමැත. | මව් මසුන් තොගය ජීව විද්‍යාත්මක වත්කමක් ලෙස සලකා ගිණුම්ගත කිරීමට ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 41 ට අනුව සුදුසු ගිණුම් ප්‍රතිපත්තියක් සකස් කරගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | අධිකාරිය විසින් භාවිතා කරන ඉඩම් 16 ක වටිනාකම 2018 දෙසැම්බර් 31 වන විටත් තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. එසේම 1998 වර්ෂයේදී අධිකාරිය ස්ථාපිත කිරීමේදී පවරන ලද උඩවලව පිහිටි රු.89,630,000 කට තක්සේරු කර තිබුණු ඉඩම් දෙකක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ඉඩම් ප්‍රත්‍යාගණනය කර වටිනාකම ලබා ගෙන නොමැත. මෙම ඉඩම්වලින් කිහිපයක් තවමත් අධිකාරියට පවරා ගැනිමේ කාර්යය නිමවී නොමැති අතර අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් හෝ පවරා ගෙන ප්‍රත්‍යාගණන කටයුතු කිරීමට නියමිතය. | අධිකාරියේ වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර තක්සේරු කර ඇති වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල රු.2,000,000 දිගුකාලීන ආයෝජනය, ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | පිලිතුරු ලබාදී නැත. | දිගුකාලීන ආයෝජන, ජංගම නොවන වත්කම් යටතේ දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (එ) | අධිකාරිය විසින් වෙනත් ආයතන වෙත පවරන ලද පොළොන්නරුව, පිටියන, පනාපිටිය යන ඉඩම් 03 රු.5,000,000 ක් වූ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගිණුම් වලින් ඉවත්කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ ගිණුම් තුලින් මෙම ඉඩම් ඉවත් කිරීමට කටයුතු කෙරේ. | වෙනත් ආයතන වලට පවරා දෙන ලද වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මුදල් රෙගුලාසි 135 (4) | වවුචර් සහතික කිරීමට බලය නොලත් නිළධාරීයකු ගෙවීම් වවුචර් 62 ක් සහතික කර ගෙවීම් සිදුකර තිබුණු අතර එහි වටිනාකම රු.96,889,323 ක් වී තිබුණි. | සියලුම ගණුදෙනු අදාළ සහතික කිරීම් හා අනුමත කිරීම් අනුව සිදු කර ඇත. යම් නිලධාරියෙකු සේවයට නොපැමිණෙන විට ඔහු හෝ ඇය වෙනුවෙන් ආවරණ අත්සන් කරනු ලබන නිලධාරියට බලය පැවරීම අධිකාරියේ සාමාන්‍ය සම්ප්‍රදායයි. ඒ අනුව ගිණුම් නිලධාරි නිවැරදිව කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 138 ප්‍රකාර වගකිව යුතු නිලධාරීන්ට බලය බෙදාහැරීම කළ යුතුය. වවුචර් සහතික කිරීම සහ අනුමත තිරීම මුදල් රෙගුලාසි විධිවිධාන වලට අනුව සකස් කළ යුතුයි. |
| (ii) මුදල් රෙගුලාසි 138(8) | වවුචරය නිවැරදි හා සැම විස්තරයක් අතින්ම සම්පූර්ණ බවත් වවුචරය සහතික කිරීමට බලයලත් නිලධාරියකු විසින් සහතික විය යුතු වුවත්, එසේ සහතිකය හා මූලාශ්‍ර ලියවිලි නොමැතිව වවුචර් ඡායා පිටපත් මූලික කරගෙන රු.5,500,000 ක් ගෙවා තිබුණි. | පිළිතුරු ලබාදී නැත. | මුදල් රෙගුලාසි 138(8) අනුව වවුචර් හා අනෙක් ලියවිලි වල මූලාශ්‍ර ලියවිලි පදනම් කර ගෙන ගෙවීම් කටයුතු කළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 396 | නිකුත් කල දින සිට මාස 06 ක් ඉක්මවා තිබූ රු.152,056 ක වටිනාකමකින් යුතු චෙක්පත් 8 ක් සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි | මාස 6 ක් ඉක්මවූ වටිනාකම රු. 152,056 ක චෙක්පත් සම්බන්ධව බැංකුවට ඉදිරිපත් නොවීමට හේතු සොයා බලා මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදි | මුදල් රෙගුලාසි අනුව කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 610 හා 2011 අප්‍රේල් 21 දිනැති අංක MOFP/ERD/2011/01 හා 2014 ජුනි මස 26 දිනැති චක්‍රලේඛ අංක MOFP/ERD/2014/01 දරන චක්‍රලේඛය. | 2018 වර්ෂයේ අවස්ථා 05 කදී ලැබී තිබුණු රු.14,602,284 ක් වටිනා විදේශ ප්‍රදාන සම්බන්ධ සියලු ගනුදෙණු විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කල යුතු වුවද එසේ කටයුතු නොකර විදේශ ප්‍රදාන ලබා දෙන ආයතන සමඟ ඍජු සබඳතා පවත්වමින් එම පාර්ශව සමඟ ගිවිසුම් ඇති කර ගෙන තිබුණි. | මෙම පර්යේෂණ කටයුතු ප්‍රධාන වශයෙන්ම වයඹ විශ්ව විද්‍යාලය හා රුහුණු විශ්ව විද්‍යාලය මඟින් සිදු කරන අතර ඒ සඳහා අවශ්‍ය මිරිදිය ඉස්සන් පැටවුන් තැන්පත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය අප අධිකාරිය මඟින් සිදු වේ. | මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xv වැනි පරිච්ඡේදයේ 5.2 හා 5.2.1 | 2015 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු ලබා අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වූ නිලධාරියකු වසර 4 මාස 07 දින 06 ක් වූ අනිවාර්ය සේවා කාලයේ සේවය නොකිරීම වෙනුවෙන් අයකර ගත යුතු රු.681,588 ක්එම නිලධාරියාගෙන් අය කර ගෙන නොතිබුණි. | 2015 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු ලබා විදේශ ගත වූ උපුල් වසන්ත කුමාර මහතා අනිවාර්ය සේවා කාලය සේවය නොකිරීම හේතුවෙන් රු. 681,588/- අයකර ගැනීම සඳහා ඔහු වෙත ලිපි යවා ඇත. එම මුදල ගෙවීමට අපහසු බවත් නැවත සේවයට පැමිණිය හැකි බව ඔහු දන්වා ඇත. ඔහු නැවත සේවයට ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතික්ෂේප කරන ලදී. ගිවිසුම් ප්‍රකාරව ඇපකරුවන්ගෙන් මෙම මුදල අයකර ගැනීමට කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහයේ xv වැනි පරිච්ඡේදයේ දැක්වෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.80,646,668 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.45,307,362 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.35,339,306 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් රු. මිලියන 76.6 ක් හා පුනරාවර්තන ආදායම් රු.මිලියන 36.9 ක් වැඩි වූවද පරිපාලන වියදම් හා බෙදාහැරීමේ වියදම් පිලිවෙලින් රු. මිලියන 98.2 කින් හා 62.5 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලය ඇතුළු මධ්‍යස්ථාන 15 ක රු. 21,409,109 ක් වූ මත්ස්‍ය දැල් ඉතිරිව තිබියදීත් 2018 සැප්තැම්බර් මස 30 දක්වා මවු මසුන් කළමනාකරණය වෙනුවෙන් වැය කළ රු.8,930,315 කින් සියයට 80 ක් හෙවත් රු.7,183,576 ක් මත්ස්‍ය දැල් මිලදී ගැනීම සඳහා වැය කර තිබුණි. දඹුල්ල, කලාවැව, උඩවලව, ඉරණමඩු, මුරුතවෙල යන මධ්‍යස්ථානවල රු.17,708,604 ක් වටිනා දැල් තොගයක් තිබියදී එම මධ්‍යස්ථාන වලටම 2018 වර්ෂයේදී රු. 4,900,000 ක දැල් බෙදා හැර තිබුණි. | දේශීය සැපයුම් ආයතනවලින් මිල ගණන් කැඳවා විදේශීය රටවලින් මිලදී ගත යුතු ය. මිලදී ගැනීමේ ක්‍රියාවලියට මාස 06 ට නොවැඩි කාලයක් ගත වේ. මේ නිසා අවශ්‍ය කරනු ලබන මෙම දැල් වර්ග අවම වශයෙන් වර්ෂ තුනක් සඳහාවත් ප්‍රමාණවත් තොග මිලදී ගැනීම සිදුකරයි. | දැල් මිලදී ගැනීමට පෙර උපරිම හා අවම තොග මට්ටම් තබා ගත යුතු අතර පවතින තොග පරීක්ෂාකර අවශ්‍යතාවය අනුව මිලදී ගැනීම් සිදු කළ යුතුවේ. |
| (ආ) | කළුටයිගර් ඉස්සන් අභිජනනය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල් ව්‍යාවසායකත්වය යටතේ අධිකාරිය රු.2,000,000 ක් ආයෝජනය කර පිහිටුවා තිබුණු අභිජනනාගාරය පිහිටුවීමේ ආයෝජන ගිවිසුම ප්‍රකාරව 2017 හා 2018 වර්ෂ සඳහා අධිකාරියට හිමිවිය යුතු ලාභ කොටස අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2018 සැප්තැම්බර් මස 20වන දින දෙවන වර මත්ස්‍ය තොගය ගෙන්වා ඇති බැවින් 2019 සහ 2020 වර්ෂ වල ලබාගත් ලාභයෙන් 30%ක් අධිකාරියට ගෙවන ලෙසට NQ/07/MO/LAGOON සහ 2019 ජුනි 25 දිනැති ලිපිය මඟින් බ්ලූ ලැගුන් ඇක්වා කල්චර් (පුද්) සමාගම දැනුවත් කිරීමක්ද සිදු කර ඇත. | හවුල් ව්‍යාවසායක ගිවිසුම් ගිවිසුම් ප්‍රකාරව 30% ක ලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | අධිකාරියේ අධ්‍යක්ෂකවරයකු සඳහා වෙන්කර තිබූ වාහනය 2018 ජූලි 30 දින අනතුරකට භාජනය වී රු.5,164,091 ක අලාභයක් සිදු වී තිබුණි. මේ සම්බන්ධයෙන් පොලිස් වාර්තා ලබා ගෙන නොතිබූ අතර 2019 අගෝස්තු 02 දිනය වන විට මාස 09 ක් ගත වී තිබුණද අළුත්වැඩියා කිරීමට සහ අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහනය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව යටතේ රක්ෂණය කර ඇති වටිනාකම රු 5,795,000.00 වේ. අලාභය වශයෙන් රු.3,500,000 ක් අධිකාරියට ගෙවීමට යෝජනාකර ඇත. මෙම මුදලට අප එකඟ නොවූ බැවින් ඉදිරියේදී නෛතිකව කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර කඩිනම් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | විශ්‍රාම ගිය නිලධාරීන් 07 දෙනෙකුට පාරිතෝෂිත ගෙවීමේදී දළ වැටුප පදනම් කර ගැනීම නිසා වැඩියෙන් ගෙවන ලද රු.381,291 ක් අයකර ගැනීමට 2019 ජුනි 10 දින දක්වාම කටයුතු නර නොතිබුණි. | පාරිතෝෂිත ගෙවීමේදී අන්තර් දීමනාව සමඟ වැටුප පදනම් කරගෙන ගණනය කිරීම හේතුවෙන් වැඩිපුර ගෙවීමට සිදු විය. කෙසේ වෙතත් මෙම මුදල් අය කර ගැනීමට කටයුතු සිදු කර ඇත. | නිවැරදිව ගණනය කර ගෙවීම් සිදුකළ යුතු අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කළපු සංවර්ධන වැඩසටහන යටතේ රු.161,400,000 ක වටිනා වල්පැළෑටි සහ සුන්බුන් ඉවත් කිරීමේ යන්ත්‍ර 03 ක් මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස රු.42,572,925 ක් සැපයුම්කරුට ගෙවා තිබුණු අතර අත්තිකාරම් ගෙවීම සාවද්‍ය බැඳුම්කර ලියවිලි හා ව්‍යාජ අත්සන් සහිත කූඨ ලේඛන පදනම් කරගෙන ගෙවා තිබුණි. මෙසේ අවිධිමත් ලෙස ගෙවූ රු.42,572,925 ක මුදල මාස 06 ක කාලයක් පෞද්ගලික පරිහරණයට ඉඩ හැර ආපසු අයකර තිබුණි. | ප්‍රසම්පාදන රීති වලට අනුකූලව අධිකාරිය විසින් සැපයුම්කරු වෙත ඉදිරිපත් කළ අත්තිකාරම් බැඳුම්කරය මත නිදහස් කර ඇත. බැඳුම්කරයෙහි සත්‍ය අසත්‍යතාව අදාළ නිකුතු බැංකුවෙන් විමසීම කරනු වෙනුවට අධිකාරයේ නීති අංශයෙන් පමණක් විමසීම් කර තිබුණි. සමාගම අසාදු ලේඛනයට ඇතුලත් කරන ලෙසට ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්ට ලිපියක්ද යවා ඇත. | මෙම කාර්යයට සම්බන්ද නිලධාරීන්ට විනය පරීක්ෂණ පවත්වා ඉදිරියේදී මෙවැනි කටයුතු වැළැක්වීමට කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | මන්නාරම දිස්ත්‍රික්කයේ ඔලෙයිතුඩාවායිහි මුහුදු කුඩැල්ලන් අභිජනනය මධ්‍යස්ථානය ඉදිකිරීමට අක්කර 01 ක ඉඩම් ප්‍රමාණයක් ලබාදී තිබියදී අක්කර 04 ක භූමි ප්‍රමාණයක් සඳහා ඉදිකිරීම් සැලසුම් සකස් කිරීම හේතුවෙන් එම ටැංකිවලින් නිෂ්පාදනය කිරීමට සැලසුම් කළ මුහුදු කුඩැල්ලන් ගණන 700,000 සිට 1,000,000 ක් වුවත් එය 350,000 කට සීමා වී තිබුණි .එසේම මෙම ව්‍යාපෘතිය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් නොකර ආරම්භ කර තිබුණි. | භූමිය වෙනස්වීම මත සැලසුම් සකස් කිරීම සඳහා උපදේශක ආයතනය වෙත අළුතින් ගෙවීමක් සිදුනොකළ අතර මුලදී කරන ලද ගෙවීම මඟින්ම නැවත සැලසුම් වෙනස් කරීම සිදුකරන ලදී. | ශක්‍යතා අධ්‍යයනයක් කර නිවැරදි සැලසුම් සකස් කළ යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මන්නාරම දිස්ත්‍රික්කයේ වනජීවී ප්‍රේරණ කලාපයට අයත් ඉඩමක වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගා නිෂ්පාදනය වැඩි කිරීම අරමුණු කරගෙන 2016 අගෝස්තු සිට 2018 අගෝස්තු දක්වා කාලය තුල අදාළ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට සැලසුම් කර, ව්‍යාපෘතිය සඳහා ජලය හා විදුලිය ලබා ගැනීම සඳහා රු.25,185,181 ක් වැය කර තිබුණි. එසේ වුවත්, 2019 පෙබරවාරි මස වන විටත් මෙම ඉඩම නිරවුල් නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොමැති බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ඉඩම නිරවුල් නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාද වී ඇත. වනජීවී ස්වභාව රක්ෂිතයෙන් අදාළ ඉඩම නිත්‍යානුකූලව බැහැර කිරීම සඳහා පරිසර අධ්‍යයන වාර්තාව (EAS වාර්තාව) වනජීවී දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. වනජීවී දෙපාර්තමේන්තුව මගින් ඉඩම නිත්‍යානුකූලව බැහැර කරන තෙක් ව්‍යාපෘතියේ අනෙකුත් කටයුතු සිදු කළ නොහැකි වී ඇත. | ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා වාර්තා සකස් කර සාර්ථක ව්‍යාපෘතියක් නම් පමණක් ඒ සඳහා රජයේ ප්‍රතිපාදන වැය කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය පාලන පද්ධතීන් සකස් කළ යුතුවේ. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නුවරඑළිය ජලජීවී මධ්‍යස්ථාන යටතේ ඇති අංක 04 සහ 06 දරන රජයේ නිවාස අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින අතර අළුත්වැඩියා කර භාවිතයට නොගෙන 2015 නොවැම්බර් සිට අතරහැරදමා තිබුණි. | වර්ෂයේ සීමිත ප්‍රතිපාදන මත අත්‍යාවශ්‍ය ඉදිකිරීම් සඳහා ප්‍රමුඛත්වය ලබා දුන් අතර ප්‍රතිපාදන අනුව ඉදිරියේ දී අවශ්‍ය අලුත්වැඩියා වක් සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

### 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මිරිදිය ඉස්සන් නිෂ්පාදනය වැඩිකිරීමේ අරමුණින් ජාතික ආහාර වැඩසටහන යටතේ කල්ලරාව මිරිදිය ඉස්සන් අභිජනනාගාරය ඉදිකිරීමට 2017 වර්ෂයේදී රු. 102,322,224 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ආරම්භකර 2018 නොවැම්බර් 05 දින වන විට වර්ෂයක කාලයක් ගත වී තිබුණද අභිජනනාගාරය තුල ඉස්සන් වගාව ආරම්භ කර නොතිබුණි. | එහි මූලික කාර්යයන් රාශියක් දැනටමත් ඉටු කර ඇති අතර 2019 අප්‍රේල් මස සිට බීජ නිෂ්පාදන කටයුතු අරඹා ඇත. මේ වන විට මිලියන 1.42 ක් මිරිදිය ඉස්සන් පසු කීටයන් නිෂ්පාදනය කර නිකුත් කර ඇත. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ආ) | මත්ස්‍ය පැටවුන් අභිජනනය කර ධීවර සමිතිවලට හා ජලාශවලට මුදාහැරීමේ අරමුණින් නුවරඑළිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය ඉදිකර තිබුණි. 2014 වර්ෂයේ ට්‍රවුට් මත්ස්‍යයන් අභිජනනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇතත්, 2018 මැයි මස සිට ට්‍රවුට් මසුන් ආක්‍රමණශීලී මත්ස්‍ය වර්ගයක් ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් නම් කිරීම හේතුවෙන් එම ව්‍යාපෘතිය නවතා දමා තිබුණි. මේ හේතුවෙන් එම අභිජනනාගාරයේ ඉදිකළ ගොඩනැගිලි සහ ටැංකි කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රියව තිබුණි. | 2017 වර්ෂයේදී මෙම ට්‍රවුට් මසුන් ආක්‍රමණශීලී ආගන්තුක මත්සයෙක් ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය මගින් නම් කරන ලදි. ඒ අනුව එම මසුන් අභිජනන හා ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලිය අත්හැර දමන්නට සිදුවිය.<br>වෙනත් මව් මසුන් යොදාගනිමින් සාර්ථක අභිජනනයක් නුවරඑළිය මධ්‍යස්ථානය තුළදී සිදුකරන ලදි. | වෙනත් මසුන් ඇති කිරීමට හෝ වෙනත් ඵලදායී කාර්යයකට මෙම වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථාන 12 ක් සඳහා රු.59,975,000 ක් වූ මත්ස්‍ය ආහාර මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මත්ස්‍ය ආහාර සාම්පල්වල දිලීර වර්ධනය හා මත්ස්‍ය ආග්‍රාණ සංවේදී බව පිළිබඳව පරීක්ෂාවක් සිදු නොකර භාවිතයට නුසුදුසු මත්ස්‍ය ආහාරමිලට ගැනීම හේතුවෙන් මාස 04 ක කාලයක් සඳහා ඇණවුම් කළ කිලෝ 17170 ක මත්ස්‍ය ආහාර සපයා නොතිබුණි. | මෙහිදී ආර්ද්‍රතාවය වැඩි වන විට තෙතමනය වැඩි වී ක්ෂුද්‍රජීවීන් වර්ධනයට හිතකර තත්ත්වයට පත්වේ. තෙතමනය සහිත පරිසරයක ගබඩා කිරීම මාළුවලට හානි වීම, ගබඩා පරිසරය අපිරිසිදු වීම වැනි කරුණු ද බලපායි. මිලදී ගන්නා අවස්ථාවේ ආහාර සුදුසු මට්ටමක පැවතියද මෙම හේතූන් නිසා පසුව ඒවාට ක්ෂුද්‍ර ජීවී ආසාදන ඇති විය හැකිය. | ආහාර මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කළ යුතු අතර ගබඩා කිරීම නිසි ප්‍රමිතියට සිදු කළ යුතුය. |
| (ආ) | කුසලබංගදෙනිය සමුද්‍රීය විසිතුරු මත්ස්‍ය අභිජනනාගාර ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රමාණ බිල්පත් පරිදි පවතින ගොඩනැගිල්ල අළුත්වැඩියාව (Existing Office Building Renovation) වෙනුවට පවතින ගොඩනැගිල්ල ඉවත්කර නැවත කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම ලෙස එම අයිතමය, එකඟ වූ ප්‍රමාණ බිල්පත් වලින් වෙනස්කර ඊට අදාළ ප්‍රමාණ වෙනස්කම් හා එකතුවූ නව අයිතම මිල ගණන් සඳහා ඉංජිනේරු අනුමැතිය යටතේ රු.943,869 ක් ගෙවීම් කර තිබුණද ඊට අදාළ විචලන නියෝග නිකුත් කර නොතිබුණි. | මෙහිදී සම්පූර්ණ කොන්ත්‍රාත්තුවේ අගය හා ඉදිකිරීම් කටයුතු කරනවිට ඇතිවන (Excess Savings) පදනම් කරගෙන කොන්ත්‍රාත් ගිවිසුමේ වූ මුදල වැඩි නොවූ නිසා ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නොමැති බව දන්වනු කැමැත්තෙමි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් වලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:3:2 මාර්ගෝපදේශය අනුව මිලියන 100 නොයික්මවන මුළු පිරිවැය ඇස්තමේන්තු අධිකාරියේ සභාපතිවරයා අනුමත කල යුතු වුවත් කොන්ත්‍රාත් 3 ක පිරිවැය ඇස්තමේන්තු සඳහා ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ඕනෑම ව්‍යාපෘතියක් සඳහා මුලින් ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දිය යුතු අතර, එම අනුමැතිය ලැබුණු ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සඳහා ගිවිසුමකට ඇතුලත්වීම සිදුවේ. ව්‍යාපෘතියට අදාළ කාර්යය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සභාපතිවරයාද ඇතුලත් ප්‍රසම්පාදන මණ්ඩලය විසින් අනුමත කරන ලද ගිවිසුම අනුව කටයුතු කෙරේ. | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව මුළු පිරිවැය ඇස්තමේන්තු සභාපතිවරයා අනුමත කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රු.මිලියන 1 ක් දක්වා පමණක් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු පත් කිරීම සිදු කළ යුතු වුවත්, වටිනාකම රු. 2,038,201 ක් වූ කඹ හා නූල් මිලදී ගැනීමේ කටයුතු සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවක් පත් කර තිබුණි. | ආරම්භයේදී අඩු වටිනාකමක් වූ අතර ඒ අනුව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව හරහා ප්‍රසම්පාදනය සිදු කරන ලදී. එනමුත් පසුව එම් වටිනාකම වැඩිවී ඇත. ඒ අනුව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව හරහා සිදුවිය යුත්තකි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පම්බල මිරිදිය ඉස්සන් අභිජනනාගාරයේ නව අභිජනන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2017 හා 2018 වර්ෂවල රු. මිලියන 40.57 ක් වූ ප්‍රතිපාදනවලින් රු.14,789,817 ක් වැය කර තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉදිකිරීම් නිම කර නොතිබුණි. අභිජනන ගොඩනැගිල්ල ඉදිකිරීම, අපවහන නළ පද්ධතින් සැකසීම ආදිය එක් කොන්ත්‍රාත්කරුවකු මඟින් ඉටුකර ගැනීමට අවස්ථාව තිබියදී අවශ්‍යතාවයක් නොමැතිව එක් එක් වැඩ කොටස් ප්‍රදානය කිරීම ප්‍රමාදයට හේතු වී තිබුණි. | තවද පම්බල මධ්‍යස්ථානයේ ඇති මුල් හැචරියට වඩා නව තාක්ෂණයෙන් යුතුව දෙවැනි හැචරිය ඉදිකිරීමට අවශ්‍ය වූ නිසා හා පර්යේෂණ අංශයන් හි ප්‍රථිපලද එක් කිරීමට කාලය අවශ්‍ය වූ නිසා නිම කිරීම් කටයුතු (Finishing Work) වන දෙවැනි අදියර ආරම්භ කිරීමට යම් කාලයක් ගත වූණි. ඒ නිසා මෙම ප්‍රමාදය සිදු වූණි. | මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන උපදෙස් වලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | රු. මිලියන 83 ක් වැයකර ඉදිකිරීමට යෝජිත හුංගම කකුළු අභිජනනාගාරය ව්‍යාපෘතියේ හෙක්ටයාර් 85 ක වපසරියකින් යුත් රජය සතු ඉඩම් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් මගින් අධිකාරිය වෙත නිදහස් කර තිබුණි. මෙම ඉහත ඉඩම් ප්‍රාදේශීය ලේකම් මගින් තෝරාගත් ආයෝජකයන් වෙත ලබා දීමට සැලසුම්කර තිබුණද එම ව්‍යාපෘතියේ ඉඩම් කොටස් පෞද්ගලික ආයෝජකයන්ට ලබා දීම සම්බන්ධව නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු අතර ප්‍රතිලාභ නැවත අයකර ගැනීම සඳහා ගිවිසුම්ඇති කර ගැනීමේ වැඩ පිළිවෙලක්ද හඳුන්වා දී නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාළව ඉඩම් කොටස් පෞද්ගලික අංශය වෙත ලබාදීමේ ක්‍රම වේදය පිළිබඳ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඇත.<br><br>මෙම වර්ෂයේ ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොමැති බැවින් පුවත්පත් දැන්වීම් පල කිරීම ප්‍රමාද කර ඇති නිසා ප්‍රතිලාභීන් තෝරා ගැනීම ප්‍රමාද වී ඇත. | ව්‍යාපෘතිය යටතේ ඉඩම් කොටස් ලබාදීමට නිශ්චිත ක්‍රමවේදයක් සැකසිය යුතු අතර ප්‍රතිලාභ අයකර ගැනීමට ගිවිසුමකට එළඹිය යුතුය. |
| (ඇ) | කුසලබංගදෙනිය සමුද්‍රීය විසිතුරු මත්ස්‍ය අභිජනනාගාරය ඉදිකිරීම සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව 2018 මාර්තු 02 දින සිට මස 9 කින් | ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇති බව දන්වනු කැමැත්තෙමි. | ගිවිසුම් අනුව නියමිත කාලය තුල නිම කිරීම සඳහා අවශ්‍ය පාලන පද්ධති සකස් කළ යුතු වේ. ඉදිකිරීම් දෙවරක් කාල දිගු |

| | | |
|---|---|---|
| 2018 සැප්තැම්බර් නිම කළ යුතු වුවද 2019 මාර්තු වන විටත් භෞතික ප්‍රගතිය සියයට 80 ක් පමණක් විය. | | ලබා දී තිබුණද ඉදිකිරීම් ප්‍රමාද වී ඇත. මේ සම්බන්ධයෙන් 2019 ජුලි 10 දිනට ඉදිකිරීම් නිමකර නොමැති බැවින් කළමනාකරණයේ අවධානය යොමුවිය යුතු වේ. |
| (ඇ) මන්නාරම ඔලෙයිතුඩායිහි මුහුදු කුඩැල්ලන් අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ සැලසුම් සකස් කිරීම හා කොන්ත්‍රාත් පරිපාලන කටයුතු වෙනුවෙන් උපදේශන සේවා කොන්ත්‍රාත්තුව රු.9,895,000 මුදලකට ප්‍රදානය කර තිබුණි. මේ වෙනුවෙන් රු.7,226,068 ක් 2017 නොවැම්බර් වන විට ගෙවා තිබුණි. එසේ වුවත් ඉදිකිරීම් කටයුතු සැලසුම් පරිදි අවසන් නොවීම හේතුවෙන් 2018 මාර්තු 29 දින නැවත වෙනත් උපදේශකවරයකු පත් කර කොන්ත්‍රාත් පරිපාලනය වෙනුවෙන් රු.3,454,500 ක්ද ගෙවා තිබුණි. | ගිවිසුමේ 5 වන වගන්තිය පරිදි ඉංජිනේරු වරයාට වගකියන ඉංජිනේරු නියොජිතයකු පත්කර ගෙන ඇති අතර ඒ අනුව ඉංජිනේරුවරයාගේ තම බලතල ඉංජිනේරු නියෝජිත වෙත පවරා ඇත. මෙහිදී ඉංජිනේරු නියෝජිත හෙවත් උපදේශක ආයතනයට අදාළ කාර්යය වෙනුවෙන් රු.3,547,500 ක් ගෙවීමක් කර ඇත. එම නිසා ඉංජිනේරු නියෝජිත (උපදේශක ආයතනය) සේවා දායකයාගේ අවශ්‍යතා ඉටුකිරීම වෙනුවෙන් ඉහතින් සඳහන් කරන ලද මුදල ගෙවා ඇත. | ඒ සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු අතර ගිණුම්ගත වූ පරිදි කටයුතු ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ දින 75 ක ප්‍රමාදයක් සහිතව එනම් 2019 මැයි 15 දිනය. තවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයට අභ්‍යන්තර විගණන සැලැස්මේ ඇතුළත් රු. මිලියන 662.87 ක් වූ කාර්යයන් අභ්‍යන්තර විගණන පරීක්ෂණයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී කාර්යමණ්ඩලයට සරිලන පරිදි විගණන සැලැස්ම පිළියෙල කරන ලෙස උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව කටයුතු කර අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ නිකුත් කරන ලද වාර්තා 11 ට අදාළව අභ්‍යන්තර විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම් පිලිබඳ පසු විපරම් කටයුතු සිදු කිරීම අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | අභ්‍යන්තර විගණන අංශයේ සේවය කරන කළමනාකරණ සහකාර දෙදෙනෙකු හට අධිකාරියේ ප්‍රධාන කාර්යාලයද ඇතුළුව ඒකක 47 ක්ද මධ්‍යස්ථාන , ව්‍යාප්ති කාර්යාල සහ අධීක්ෂණ ඒකක ඇතුළුව ඒවායෙහි700 කට අධික කාර්ය මණ්ඩලයේ කාර්යයන් විගණනය කළ යුතුව ඇත . එබැවින් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිව අභ්‍යන්තර විගණන සැලැස්මද ආවරණය කිරීමට නොහැකි වූ අතර විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා ඒ පිළිබඳ පසුවිපරම් කිරීම අඩාල වී ඇත . කෙසේ වෙතත් ඉදිරියේදී මෙම තත්වය අවම කර ගැනීමට උපදෙස් ලබා දී ඇත. | අභ්‍යන්තර විගණන වාර්තා වල දැක්වෙන අඩුපාඩු කෙරෙහි අවදානය යොමුකර සමස්ථයම නිවැරදි කර ගැනීම සඳහා මුදල් රෙගුලාසි 133 ප්‍රකාර අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කළ යුතු වේ. |
| (ඇ) | අධිකාරියේ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන 16 ක් ප්‍රධාන කාර්යාලය ඇතුළුව දිස්ත්‍රික් ජලජීවී ව්‍යාප්ති කාර්යාල 23 ක් සහකාර අධ්‍යක්ෂක කාර්යාල 04 ක් සහ අධීක්ෂණ ඒකක (Monitoring Office) 03 ක්ද ඇතුළුව කාර්යාල 47 ක මූල්‍ය විගණනය, පද්ධති විශ්ලේෂණය, කාර්යය සාධන විශ්ලේෂණය හා විශේෂ විමර්ශන කෙරෙහි අවධානය යොමුකර අභ්‍යන්තර විගණන කටයුතු ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන කාර්යය මණ්ඩලයක් නොමැති බැවින් ප්‍රමාණවත් පරීක්ෂණ ක්‍රියාත්මක වී නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 133 කෙරෙහි අවදානය යොමුකර අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රමවේද යෙදිය යුතු වේ. |

**4.3** **තිරසාර සංවර්ධන අරමුණු**

**---------------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------------- | ------------------------------ | --------------- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී ඇති බව හා ඊට අදාළ කාර්යසාධන දර්ශක 12 ක් (KPI) ලෙස හඳුනාගෙන තිබුනද ඉලක්ක මත ලඟා වීම් මැන බැලීම සඳහා හඳුනාගත් දර්ශක යොදාගෙන නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම ඉදිරිපත් කර නොතිබුණි. | තිරසාර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර එම "න්‍යාය පත්‍රය" පදනම් කරන එම කාර්යය සාධනය ලබා ගැනීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |